# වැසීයන ශ්‍රී ලාංකේය බෞද්ධ විහාරස්ථාන සුරක්ෂිත කිරීමට ගතයුතු සව්බල ක්‍රියා මාර්ග

**- ආචාර්ය කනංගමුවේ රාහුල හිමි**[1]

බුද්ධ ශාසනයේ පැවැත්ම තහවුරු කෙරෙන ප්‍රධාන බලවේගය වන්නේ භික්ෂූන් වහන්සේය. ධර්ම විනය ආරක්ෂා කරන්නේ භික්ෂූන් වහන්සේ බැවින් උන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම ශාසනාරක්ෂාවෙහි මුඛ්‍යාර්ථය වේ. භික්ෂූන්ගේ හිගකම නිසා ශ්‍රී ලංකාව තුළ බුදුදහම ආරක්ෂා කර ගැනීමෙහිලා උද්ගත වී ඇත්තේ ප්‍රබල අභියෝගයකි. බෞද්ධ කටයුතු කොමසාරිස්තුමා 2010 වර්ෂයේ ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන අනුව ලංකාවේ වෙහෙර විහාර 10920 ඇත. භික්ෂූන් ගණන 37691 කි. 2010 දි වැසී ගිය විහාරස්ථාන ගණන හාරසියයකට අධිකය. 2010 දි වැසීගිය විහාරස්ථාන ගණන 153 දක්වා අඩු වී තිබේ. විහාරස්ථාන වැසී යාමට හේතු කවරේදැයි විමර්ශනය කොට හඳුනාගත් ප්‍රශ්නවලට විසඳුම් යෙදිය යුතුය. අන්‍යාගමිකකරණය සිදුවන මේ කාලයේ වැසී යන වෙහෙර විහාරස්ථානවලට භික්ෂූන් යොමු නොකළහොත් උද්ගත වන තත්ත්වය ඉතා හානිදායකය. ශාසනය රැකෙන්නටත්, සමාජය ගුණ දහමින් පෝෂිත කරවීමටත් පන්සල රැක ගැනීම යුග අවශ්‍යතාවකි. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන නිකාය තුනට භික්ෂු පාර්ශව 32ක් ඇතුළත් වුවත් වැසී යන විහාරස්ථානවලට භික්ෂූන් යොමු කරවීමට නිසි ක්‍රියාමාර්ගයක් නැතිකම ප්‍රධානතම අඩුපාඩුවකි. තරුණ භික්ෂූන් උපැවිදි වීම හා මහණ කිරීමට කුල දරුවන් සොයා ගැනීම පන්සල් වැසීයාමේ ප්‍රධානතම ගැටලුවයි. උගත්කමට සරිලන රැකියාවක් නොලැබීම, තරුණ භික්ෂූන් විහාරස්ථානවල හුදකලා වීම හා පවුල්වල උද්ගත වන ප්‍රශ්න හමුවේ බොහෝ තරුණ භික්ෂූන් උපැවිදි වන අතර මේ ප්‍රශ්නවලට ඍජු පිළිතුරු සපයන්නෙක්ද නැත. **"පුංචි පවුල රත්තරං"** සංකල්පයෙන් අපට දායාද කළ ප්‍රධානතම ව්‍යසනය භික්ෂු සංස්ථාව නැති කර දැමීමයි. නිකායාන්තර නිසාද ඇතැම් විහාරස්ථාන වැසී ගිය අවස්ථා ඇත. භික්ෂූන් පහසුකම් සහිත ප්‍රදේශවලට සේන්දු වීමද දුෂ්කර පළාත්වල විහාරස්ථාන වැසීයාමට බලපාන ගැටලුවකි. දේශපාලනික වශයෙන් භික්ෂූන්ගේ බෙදීයාම නිසා නිසි නායකත්වයක් නොලැබීමද තවත් ප්‍රබල ප්‍රශ්නයකි. ලෞකික ලෝකයේ තරගකාරිත්වයට හසුවීම නිසා භික්ෂු නායකත්වයේ දක්නට ඇත්තේ ගැටලුකාරී තත්ත්වයකි. එසේම සියලු භික්ෂු පාර්ශ්වයන් එකතු වී භික්ෂූන්ට පොදුවේ සම්මත වූ කතිකාවතක් නොවීම ද මේ සඳහා වක්‍රාකාරව බලපානු ලබයි. ඇතැම් ප්‍රදේශවල ගමන් අපහසුතා හා ප්‍රත්‍ය පහසුකම් සලසා ගැනීමේ දුෂ්කරතාව නිසාද භික්ෂූන් විහාරස්ථාන අත්හැර දමන බවක් දක්නට ලැබෙයි. දායක කාරකාදීන් භික්ෂූන් පිළිබඳ දක්වන ආකල්ප ඇතැම් විටකදි හානිකරය. භික්ෂුව ආරක්ෂා කර ගැනීම වෙනුවට ඇතැම් පිරිස් භික්ෂූන් තම විහාරයෙන් නෙරපා හරින අවස්ථාද දක්නට ලැබෙයි. හුදකලා වූ තරුණ භික්ෂූන් වැරදි මාවතකට එළඹෙන්නේ නම් එයින් මුදවා ගැනීම ද බෞද්ධයාගේ ප්‍රධාන වගකීමක් විය යුතුය. වගකීම් හා යුතුකම් පිළිබඳ නොතකා හැර අයිතිවාසිකම් ගැන පමණක් සිතීමද තරමක් ගැටලු සහගත තත්ත්වයකි. දැනට සිටින භික්ෂූන් ආරක්ෂා කර ගැනීමටත්, මහණ කිරීමට කුල දරුවන් සසුනට පූජා කිරීමෙනුත් මේ වැසී යන විහාරස්ථාන වලට භික්ෂූන් යොමු කළ හැකි බවත්

---

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

*"වැසීයන ශ්‍රී ලංකේය බෞද්ධ විහාරස්ථාන සුරක්ෂිත කිරීමට ගතයුතු සවිබල ක්‍රියාමාර්ග"*, National Coference 2013, Bhiksu University of Sri Lanka, Anuradhapura, 27th & 28th December 2013.

එමගින්ම සදාචාර සම්පන්න සමාජයක් තව දුරටත් ආරක්ෂා කර ගත හැකි බවත් අප කවුරුත් අවබෝධ කර ගත යුතුය. **"ගමයි පන්සලයි"** සංකල්පය නැවතත් ඇති කළ යුතුය. එසේ නොවුණහොත් වැසී යන විහාරස්ථාන වෙනුවට ඒ ගම්වල අන්‍යාගමික ආගමික මධ්‍යස්ථාන ඇතිවීම වැලැක්විය නොහැකි වෙයි.

**ප්‍රමුඛ පදඃ භික්ෂුව, ගම, විහාරස්ථානය, ගැටලු, හිඟකම**